රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2021.08.03

නිවේදන අංක: 768/2021
නිකුත් කරන ලද වේලාව :15:30

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු

## 2021 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛනයේ ලියා පදිංචිය මාර්ගගත ක්‍රමයට

2021 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචි වීමට මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කිරීම සඳහා වූ වැඩපිළිවෙලක් (Online Registration Programme) හඳුන්වාදීම අද (03) පෙරවරුවේ රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේදී සිදු කෙරිණ.

2021 වසර සඳහා ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුලත් කර ගැනිමට සුදුසුකම් ලැබූ වයස අවුරුදු 18 සම්පූර්ණ වන ශ්‍රී ලාංකික පුරවැසියන් ලියාපදිංචි කිරීම, පවතින ඡන්ද හිමි නාම ලේඛනයේ ස්වකීය නමෙහි යම් අඩුපාඩුවක් හෝ මුද්‍රණ දෝෂ හෝ ඇත්නම් නිවැරදි කිරීම, පදිංචිය වෙනස් වීමක් සිදු වූයේ නම් එය සටහන් කර ගැනීම, 2020 වර්ෂයේ ලියාපදිංචි නොවූ ඡන්ද දායකයින් ලියා පදිංචි කිරීම මෙම වැඩපිළිවෙල යටතේ සිදු කෙරේ.

නව මාර්ගගත ලියාපදිංචියට අදාළ තොරතුරු සපයා ගැනීම මැතිවරණ කොමිෂන් සභාවේ www.election.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් සිදු කළ හැක. ලියාපදිංචි වීම සඳහා එමගින් ඉල්ලුම් කළ හැක.

මෙම ක්‍රමවේදය මගින් කරනු ලබන ඉල්ලීම් 1980 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ සඳහන් විධිවිධාන අනුව 2021 වර්ෂයේදී ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන ලිපිනයෙහි ලියාපදිංචි කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කෙරේ.

රට තුළ පවත්නා කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඇති බාධා හා අනවශ්‍ය ප්‍රමාදවීම් වළක්වා ගැනීම සඳහා මෙම නව ක්‍රමවේදය භාවිත කරන්නැයි මැතිවරණ කොමිෂන් සභාව මහජනතාවගෙන් ඉල්ලා සිටී.

මේ පිළිබඳව ගැටලු ඇත්නම් නම් eservices@election.gov.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරන මෙන් මැතිවරණ කොමිෂන් සභාව දැනුම් දෙයි.

163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො t (+94 11) 2515759
ෆැ பெ f (+94 11) 2514753
ඊ மி e infodept@slt.lk
www.news.lk

මෙම අවස්ථාවට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති නීතිඥ නිමල් ජී පුංචිහේවා, මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් රත්නායක, සහ එහි සාමාජික එස්.බී. දිවාරත්න, එම්.එම්. මොහමඩ්, කේ.පී.පී.පතිරණ, ජීවන් ත්‍යාගරාජා යන මහත්වරු ඇතුළු නිලධාරීහු රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මීට අදාළ ඡායාරූප හා වීඩියෝ දර්ශන පහත Vishmitha Cloud ගිණුමෙන් ලබා ගත හැක.

https://www.vishmithacloud.com/s-9g8vwRvG

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**